Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

8 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

## I - කොටස

- අංක 01 සිට 06 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 අෂ්ට ගරු ධර්ම වලට අයත් නොවන කරුණ තෝරන්න.

(1) උපසම්පදාවෙන් වස් සියයක් ඉක්ම වූ මෙහෙණියක වූව ද එදින ම උපසම්පදාව ලද භික්ෂුවක දැක වැඳිය යුතුය, ගරු කළ යුතුය.

(2) මසකට දෙවරක් මෙහෙණිය භික්ෂූන්වහන්සේලාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

(3) භික්ෂූන් වහන්සේ නොමැති පෙදෙසක මෙණෙිය වස් විසිය යුතුය.

(4) ඇවැතකට පත් මෙහෙණිය භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා කෙරෙහි මානත් පිරිය යුතුය.

02 '' බුදු රජාණන් වහන්සේ කනට සුව එළවන ලෙස කථාබහ කරන සේක'' බුදුරජාණන්වහන්සේ තුළ පැවති එම ගුණය හඳුන්වන්නේ,

(1) ඒහිසාගතවාදී බව යනුවෙන් ය. (2) සඛිල බව යනුවෙන් ය.

(3) සම්මෝදක බව යනුවෙන් ය. (4) අබ්භාකුටික බව යනුවෙන් ය.

03 බුදුරජාණන්වහන්සේ රජගහ නුවර සීත වනයේ වැඩ සිටිය දී උන්වහන්සේ හමුවීමේ බලවත් කැමැත්ත නිසා රැය නිදි නොලබාම ඇවිද ආ ධනවත් සිටුවරයා කවුද ?

(1) සුදත්ත සිටුතුමා (2) පූර්ණාවර්ධන සිටුතුමා

(3) මෙණ්ඩක සිටුතුමා (4) ජෝතිය සිටුතුමා

04 ''බුදුරජාණන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය නුවණැත්තන් විසින් තම තමා වෙත වෙනම අවබෝධ කර ගත යුතුය. තමාගේම නුවණින් තමාගේම අත්දැකීමක් බවට පත් කර ගත යුතුය'' ධර්මයෙහි පවතින එම ගුණය හැඳින්වෙන්නේ,

(1) ස්වක්ඛාත යනුවෙනි (2) සන්දිට්ඨික යනුවෙනි

(3) ඕපනයික යනුවෙනි (4) පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි යනුවෙනි.

05 පිරිත් මණ්ඩපය ඉදි කිරීමේ දි පිරිත් පුරන ස්වාමීන් වහන්සේලා දෙනමට වැඩ සිටීමට සකසන යුග පුටුව පිටුපසින් අතු කිහිපයක් සහිත පුවක් පැලයක් තැබීම සිදු කරයි. එසේ පුවක් පැළයක් තබා කරන ඉදිකිරීම හඳුන්වන නම කුමක් ද?

(1) වලයම (2) රාජගහ (3) මල්පැල (4) වියන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 ස්වාමීන් වහන්සේලාට පිරිතට ආරාධනා කිරීම සඳහා භාවිතා කරන ගාථාව වන්නේ,

(1) විපත්ති පටිභානාය ..... යන ගාථාවයි. (2) නත්ථි මේ සරණං අඤ්ඤං යන ගාථාවයි.

(3) ඉදං මේ ඤාතිනං හෝතු යන ගාථාවයි. (4) ඕවාද සිප්ප දානේන යන ගාථාවයි.

- **අංක 07 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න. (අගති චරියා, කාම තණ්හා, සම්මානනා, සංඛාර)**

07 ගෙදර දොර කටයුතු වලදී බිරිඳ කොන් කිරීමෙන් තොරව ඇයට නිසි ගෞරවයෙන් සැලකීම ........................................................................................................................................ නම් වේ.

08 ........................................................................... යනුවෙන් හැඳින්වෙන්නේ ස්වාමියා හෝ බිරිඳ වෙනත් ස්ත්‍රීන් හෝ පුරුෂයන් හෝ සේවනයෙන් වැළකීම ශිෂ්ට සම්පන්න ක්‍රියා කිරීමකි.

09 පංචස්කන්ධයෙහි මානසිකව කරන රැස් කර ගැනීම ............................................................................................ යනුවෙන් හැඳින්වේ.

10 ........................................................................... යනුවෙන් හැඳින්වෙන්නේ පස්කම් සැපයෙහි ඇලීම හෙවත් ඉඳුරන් පිනවීමේ ආශාවයි.

- **පහත A තීරුවේ දැක්වෙන්නේ බුදුරජාණන්වහන්සේ වැඩසිටි ස්ථාන කිහිපයකි. B තීරුවේ දැක්වෙන්නේ බුදුරජාණන් වහන්සේ දේශණා කළ සූත්‍ර කිහිපයකි. A තීරුවේ දැක්වෙන ස්ථානයට අදාළ සූත්‍රය B තීරුවෙන් තෝරා එම සූත්‍රයට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | A | | B |
|---|---|---|---|
| 11 | බරණැස ඉසිපතන මිගදාය | (   ) | 1. මහා මොග්ගල්ලාන සූත්‍රය |
| 12 | ඉච්ඡානංගල බමුණු ගම අසල වන ලැබ | (   ) | 2. මහා සීහනාද සූත්‍රය |
| 13 | අචිරවතී නදී තෙර අසල අඹ වනය | (   ) | 3. තේවිජ්ජ සූත්‍රය |
| 14 | විශාලා මහනුවර අසල වන ලැහැබ | (   ) | 4. අම්බට්ඨ සූත්‍රය |
| 15 | කලන්දක නිවාපය නම් වනය | (   ) | 5. දම්සක් පැවතුම් සූත්‍රය |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල දී තිබෙන ප්‍රකාශය නිවැරදි නම් ( ✓ ) ලකුණ ද, වැරදිනම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

16 ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසු සූත්‍ර පිටකයේ මජ්ඣිම නිකාය ආරක්‍ෂා කිරීමට භාර වූයේ සැරියුත් මහ තෙරුන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම් පරාවටය. (   )

17 බුදුරජාණ් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කළ චිතකයෙහි ධාතූන් වහන්සේලා අට නමක් සිඳී බිඳී විසිරී නොගොස් ඉතිරිව පැවතිණි. (   )

18 කිසියම් රාජ්‍යයක ආයතනයක හෝ සංවිධානයකට පාලනය කටයුතු භාර පිරිස නිතර නිතර රැස්වේ නම් ඇතිවන ගැටළු සාමකාමීව හා සාධාරණව නිරාකරණය කරගත හැකිය. (   )

19 'සුභාෂිතා ච' යනුවෙන් මංගල සූත්‍රයේ දැක්වෙන්නේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව යන්නයි. (   )

20 මවුපියන්ට උපස්ථාන කිරීම උතුම් මංගල කාරණයකි. (   )

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින්ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංග දෙකක් නම් කරන්න.

(ii) ''ඇම පමණින් පැවසූ මුනි දන      තතු

මෙම හැම දෙන බලවයි දක්විය      යුතු''

යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(iii) '' උපාය කුසලතාවයෙන් යුතු වෙමු'' යන පාඩමේ සඳහන් වන මහෞෂධ කුමාරයා විසඳූ ප්‍රශ්න වර්ග දෙක නම් කරන්න.

(iv) සත්ත්වයගේ මරණය සතරාකාරවේ ඒවායින් දෙකක් නම් කරන්න.

(v) නැවත නැවත උපදිමින් පස්කම් සැප විදීමට ඇති ආශාව හඳුන්වනු ලබන නම කුමක් ද?

(vi) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය හා එයට සහභාගි වූ රහතන් වහන්සේලා ගණන සඳහන් කරන්න.

(vii) බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව වන දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන ලද්දේ කොහෙදීද ?

(viii) අනණ සූත්‍රයේ සඳහන් පරිදි ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරෙන් දෙකක් නම් කරන්න.

(ix) බුදු දහමේ සඳහන් වන පරිදි නොකළ යුතු වෙළෙඳාමේ පහෙන් දෙකක් නම් කරන්න.

(x) සතර සංග්‍රහ වස්තුවලින් දෙකක් නම් කරන්න. (ලකුණු $2 \times 10 = 20$)

02 (i) සිදුහත් කුමරු උපත ලැබුවේ කොහෙදීද ? (ලකුණු 02)

(ii) බුදු දහමෙහි උගන්වන දිවා රෑ පින් වැඩෙන පින්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පාසල් ශිෂ්‍යයකු ලෙස තුරුලතා ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ කළ යුතුදේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

03 (i) ''අසේවනාච බාලානං'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවෙන් පෙන්වා දී ඇති මංගල කරුණු තුන සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) එම මංගල කරුණු තුනට අනුව ඔබ ජීවිතය සාර්ථක කර ගත හැක්කේ කෙසේ දැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)

04 (i) දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩමවන ලදදේ කවුරුන් විසින් ද? (ලකුණු 02)

(ii) දළදා වහන්සේ උදෙසා දිනකට තුන්වරක් පුද පූජා පැවැත්වේ. එම පූජා වර්ග තුන නම් කරන්න (ලකුණු 03)

(iii) බෞද්ධයන් වන අප විසින් දළදා වහන්සේ ආරක්ෂා කරගත යුත්තේ කුමක් නිසා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

05 (i) බුදුරජාණන් වහන්සේ සප්ත අපරිහානීය ධර්ම දේශනා කරන ලද්දේ කාහට ද? (ලකුණු 02)

(ii) සප්ත අපරිහානීය ධර්ම වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ ඔබගේ පාසලේ සමිතියක සභාපති තුමා හෝ තුමිය යැයි සිතන්න. ඒ අනුව එම සමිතිය සාර්ථකව පවත්වාගෙන යෑමට සප්ත අපරිහානී ධර්මවලින් කිහිපයක් උපයෝගී කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

06 (i) සීලය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) පන්සිල් පදවලින් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ''පන්සිල් සුරැකීමෙන් යහපත් ජීවිතයක් ගොඩනගා ගත හැකිය'' මේ බව පැහැදිලි කරන්න. (ලකුණු 05)

07 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) අවමංගල චාරිත්‍ර

(ii) බුදු ගුණ භාවනාව

(iii) වෙසක් පොහොය

(iv) දේවදත්ත තෙරුන් (ලකුණු 05 x 02 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 3 (02) 2 (03) 4 (04) 4 (05) 2 (06) 1 (07) සම්මානන

(08) අගති චරියා (09) සංචාරක (10) කාම තණ්හා (11) 5 (දම්සක් පැවතුම් සූත්‍රය)

(12) 4 ( අම්බට්ඨ සූත්‍රය) (13) 3 (තේවිජ්ජ සූත්‍රය (14) 2 (මහා සීහනාද සූත්‍රය)

(15) 1 (මහා මොග්ගල්ලාන සූත්‍රය (16) ✓ (17) × (18) ✓ (19) × (20) ✓

(ල. 20 x 20 = 40)

## II කොටස

01 (i) සුහදශීලී කතාබහ, අගන්තුක සත්දාරය්, මහජන මතයට ගරු කිරීම, අල්පශබ්දතාව, නිහතමානි බව (ලකුණු 02 යි)

(ii) තම තම නැන පමණින් දන ගත යුතු
මම නමදිමි සදහම් පහාදා සිතු (ලකුණු 02 යි)

(iii) දණ්ඩක ප්‍රශ්ණය, වැලියොත් ප්‍රශ්ණය (ලකුණු 02 යි)

(iv) ආයුක්ඛය (ආයුෂ ගෙවී යාම) / කම්මක්ඛය ( කර්ම ශක්තියෙන් අවසන් වීම) / උභයක්ඛය (ආයුෂත් කර්ම ශක්තියත් දෙකම අවසන් වීම) / උපච්ඡේදක (ආයුශත් කර්ම ශක්තියත් දෙකම ඉතිරිව තිබිය දී හදිසි අනතුරු ලෙඩ රෝග වැනි කිසියම් උපද්‍රවයක් පැමිණීම. (ලකුණු 02 යි)

(v) භව තණ්හා (ලකුණු 02 යි)

(vi) රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයෙහි සප්තපර්ණී නම් ලෙන අභියස - 500 (ලකුණු 02 යි)

(vii) බරණැස ඉසිපතන මිගදායේ දී (ලකුණු 02 යි)

(viii) අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ (ලකුණු 02 යි)

(ix) අවි ආයුධ වෙළදාම, සත්ත්ව වෙළෙදාම, වස වෙළදාම (ලකුණු 02 යි)

(x) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය (ලකුණු 02 යි)

(ලකුණු 2 x 10 = 20)

02 (i) ලුම්බිණි සල් උයනේ දී (ලකුණු 02 යි)

(ii) මල්පල උයන්වතු වැවීම, වන වගා කිරීම, ඒ දඬු පාලම් තැනීම, පැන්හල් පොකුණු ආවාස තැනීම (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03 (i) අසේවනාච බාලානං
පණ්ඩිතානංච සේවනා
පූජාච පූජනීයානං
ඒතං මංගල මුත්තමං (ලකුණු 02)

(ii) බාලයන් ඇසුරු නොකිරීම / පණ්ඩිතයන් ඇසුරු කිරීම / පිදිය යුත්තන් පිදීම (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04 (i) හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් විසින් (ලකුණු 02)

(ii) අලුයම පූජාව, නව පෑ පූජාව, හැන්දෑ පූජාව (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05 (i) ලිච්ඡවීන්ට / වජ්ජීන්ට (ලකුණු 02)

(ii) නිතර රැස් වීම / සමගිව රැස්වීම, සමගිව සාකච්ඡා කිරීම, සමගිව විසිර යෑම / නොපැනවූ නීතී නොපැනවීම හා පැනවූ නීති කඩ නොකිරීම / වැඩිහිටියන්ගේ උපදෙස් පිළි පැදීම හා ඔවුන්ට ගරු කිරීම / විවාහක කුල කාන්තාවන්ගේ හා අවිවාහක කුල කුමරියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම / වජ්ජී රාජ්‍ය ඇතුළත් හා පිටත පිහිටි පූජනීය ස්ථාන වලට ගරු කිරීම හා ඒවා නඩත්තු කිරීම / තම රාජ්‍යයට නොපැමිණි පූජ්‍ය පක්ෂය ගෙන්වා ගැනීම හා පැමිණ සිටින පූජ්‍ය පක්ෂයට රැකවරණය සැලසීම (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06 (i) කය සහ වචනය සංවර කර ගැනීම (ලකුණු 02)

(ii) පානාතිපාතා වේරමණි සික්ඛාපදං සමාදියාමි / අදින්නාදානා වේරමණි සික්ඛාපදං සමාදියාමි / කාමේසුමිච්ඡාචාරා වේරමණි සික්ඛාපදං සමාදියාමි / මුසාවාදා වේරමණි සික්ඛාපදං සමාදියාමි /සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමනි සික්කාපදං සමාදියාමි (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05

07 පෙළ පොතෙහි 29, 30, 34, 35, 36, 37, 01, 02 පිටු බලන්න. (ලකුණු 05 x 02 = 10)